# සමුපකාර අනන්‍යතාවය පිළිබඳ ප්‍රකාශය - 1995

**The 1995 ICA Statement on the Cooperative Identity**


<u>අනුවර්තනය</u>

ප්‍රභාත් ගලගමගේ



**ප්‍රකාශනය**

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

දකුණු පළාත

**www.dakshinacoop.org**


*PDF (Portable Document Format) ගොණු ආකෘතියෙන් දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ* www.dakshinacoop.org *වෙබ් අඩවියේ අතත්‍ය පොත්හලින් (Virtual Book Shop) නොමිලයේ අවපතනය කරගත හැක / මාර්ගගතව (On Line) කියවිය හැක.*


*2009 ජූලි මස ඊ – පොත් පිංචක් (e-Booklet) ලෙස දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ www.dakshinacoop.org වෙබ් අඩවිය ඔස්සේ පලමු වරට ප්‍රකාශයට පත්කරන ලදී*

# 1995 සමුපකාර අනන්‍යතාවය පිළිබඳ ප්‍රකාශය
## The 1995 ICA Statement on the Cooperative Identity

## A. DEFINITION නිර්වචනය

සමුපකාරය යනු ස්වේච්ඡාවෙන් ඒකාබද්ධ වූ පුද්ගලයන් ගේ ස්වයංපාලිත සංගමයක් ඔස්සේ ඔවුන්ගේ පොදු ආර්ථික, සමාජීය, සහ සංස්කෘතික අවශ්‍යතා සහ අභිලාශයන් ඉටු කරන සාමූහික අයිතිය හා ප්‍රජාතාන්ත්‍රික පාලනය ඇති ව්‍යවසායකත්වයකි

## B. VALUES සාරධර්ම

ස්වෝපකාරය, ස්වයං වගකීම, ප්‍රජාතන්ත්‍රවාදය, සමානාත්මතාවය, සාධාරණත්වය හා සාමූහිකත්වය යන සාරධර්ම මත සමුපකාරය පදනම් වේ . එසේම ඔවුන්ගේ පුරෝගාමීන්ගේ සම්ප්‍රදාය අනුව සමුපකාර සාමාජිකයෝ අවංකත්වය, විවෘතභාවය, සමාජ වගකීම සහ අනෙකා පිළිබඳව ගරුකිරීම යන ආචාර ධර්මික සාරධර්ම පිළිබඳවද විශ්වාස කරති

## C. PRINCIPLES මූලධර්ම

සමුපකාර මූලධර්ම යනු සමුපකාර සාරධර්ම භාවිතයක් බවට පත් කරගන්නේ කෙසේද යන්න පිළිබඳ මාර්ගෝපදේශයකි.

**1st Principle: VOLUNTARY AND OPEN MEMBERSHIP**
**පළමු මූලධර්මය : ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය**

සමුපකාර යනු ස්වේච්ඡා සංවිධානයන්ය, සාමාජිකත්වයට අදාල වගකීම් ස්ව කැමැත්තෙන් පිළි ගන්නා සියලු පුද්ගලයන්ට පුමතිරිමය, සමාජ, වාර්ගික, දේශපාලනික, හෝ ආගමික වශයෙන් වෙනස්කොට සැලකීමෙන් තොරව එහි සේවාවන් භාවිතයට විවෘතය.

**2nd Principle: DEMOCRATIC MEMBER CONTROL**
**දෙවන මූලධර්මය : ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය**

සමුපකාරය යනු සාමාජිකයන් ක්‍රියාකාරී ලෙස ප්‍රතිපත්ති සැකසීමට සහ තීරණ ගැනීමේ කාර්යයන් සඳහා සහභාගීවන සාමාජිකයන්ගෙන් පාලනය වන ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානයකි . කාන්තාවන් හා පිරිමින් සාමාජිකත්වයට වග කියන ඡන්දයෙන් තේරීපත් වූ නියෝජිතයන් ලෙස කටයුතු කරනු ඇත . ප්‍රාථමික සමුපකාර සමිති තුල සාමාජිකයන්ට සමාන ඡන්ද අයිතිය ඇත (එක් සාමාජිකයෙකුට එක ඡන්දයයි). අනෙකුත් මට්ටම් වල සමුපකාරද ප්‍රජාතන්ත්‍රික ශෛලියකට සංවිධානය වනු ඇත.

**3rd Principle: MEMBER ECONOMIC PARTICIPATION**
**තෙවන මූලධර්මය : සාමාජික ආර්ථික සහභාගිත්වය**

සාමාජිකයන් සමානාත්මක ලෙස හා ප්‍රජාතාන්ත්‍රික ලෙස ඔවුන්ගේ සමුපකාරයේ ප්‍රාග්ධනය පාලනය කරයි . එසේම මෙම ප්‍රාග්ධනයෙන් යටත් පිරිසෙයින් කොටසක් වත් සාමාන්‍යයෙන් සමුපකාරයේ පොදු දේපලක් බවට පත් වේ . ප්‍රාග්ධන දායකත්වය සාමාජිකත්වයේ කොන්දේසියක් නම් සාමාජිකයින් සාමාන්‍යයෙන් ඒ වෙනුවෙන් සීමිත වන්දියක් ලබා ගනිති . සාමාජිකයන් අතිරික්තය පහත කුමන හෝ කාර්යයක් සඳහා වෙන් කරති: සමුපකාරය සංවර්ධනයට; සමහර අවස්ථාවලදී සංචිත පිහිටුවීමට, එසේම ඒවායින් කොටසක් බෙදිය නොහැකි ලෙස; සාමාජිකයන් සමුපකාරය සමඟ කරුණු ලැබූ ගණුදෙනු වලට සමාන්තර ප්‍රතිලාභයන් ලෙස ; සහ සාමාජිකත්වය විසින් අනුමත කල වෙනත් ක්‍රියාකාරකම් සඳහා

**4th Principle: AUTONOMY AND INDEPENDENCE**
**සිව්වන මූලධර්මය : ස්වයංපාලනය හා ස්වෛරීභාවය**

සමුපකාර එහි සාමාජිකයන් මගින් පාලනය වන ස්වයංපාලිත, ස්වසාධන (ස්වෝපකාර) සංවිධානයන්ය. ඔවුන් රජය ඇතුළුව, වෙනත් සංවිධාන සමඟ ගිවිසුම්ගත වේ නම් , හෝ බාහිර සම්පත් මගින් ප්‍රාග්ධනය වර්ධනය කර ගනී නම්, සාමාජික පාලනය හා ස්වයංපාලිත බව ආරක්ෂා වන ලෙස එම කාර්යයන් සිදු කල යුතුවේ.

**5th Principle: EDUCATION, TRAINING AND INFORMATION**
**පස්වන මූලධර්මය : අධ්‍යාපනය, පුහුණුව හා තොරතුරු**

සමුපකාර තම සාමාජිකයන් සඳහා අධ්‍යාපනය හා පුහුණුව සම්පාදනය කරයි. මැතිවරණයෙන් තේරීපත් නියෝජිතයන්, කලමනාකරුවන්, සහ සේවකයන් ට තම සමුපකාරය වර්ධනය සඳහා දායකවිය හැක .

ඔවුන් පොදු ජනයාට , ප්‍රධාන වශයෙන්ම තරුණ ජනයාට හා මතවාදී නායකයින්ට සහයෝගීතාවයේ ස්වාභාවය හා ප්‍රතිලාභ පිලිබඳව සැලකර සිටිනු ඇත.

**6th Principle: COOPERATION AMONG COOPERATIVES**
**හයවන මූලධර්මය : සමුපකාර අතර සහයෝගීතාව**

තම සාමාජිකයන්ට සේවා සම්පාදනයේදී සමුපකාර ව්‍යාපාරයේ දෘඩතර ශක්තිය වනු ඇත්තේ ප්‍රාදේශීය , ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර ව්‍යුහය තුල ඒකාබද්ධව ක්‍රියාකිරීමයි.

**7th Principle: CONCERN FOR COMMUNITY**
**හත්වන මූලධර්මය : ප්‍රජාව පිළිබඳ සැලකිලිමත්වීම**

සමුපකාර ක්‍රියාත්මක වන්නේ සාමාජිකත්වය විසින් අනුමතකල ප්‍රතිපත්ති ඔස්සේ ඔවුන්ගේ ප්‍රජාවේ ධරණීය සංවර්ධනයක් ඇතිවන පරිදිය.

[ජාත්‍යන්තර සමුපකාර සංධානය විසින් 1995 වසරේදී සූත්‍රගතකරන ලද අතර 2001 වසරේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ 2002 වසරේදී ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් අනුමත කරන ලදී]
*[Formulated by the International Cooperative Alliance (ICA) in 1995, affirmed by the United Nations (UN) in 2001 and the International Labour Organisation (ILO) in 2002.]*

©සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - දකුණු පළාත, 2009

අකුරු වර්ගය :- *Iskoola Pota (UNICODE Sinhala)*
ප්‍රමාණය :- *15 pt*
පිටුවේ ප්‍රමාණය :- *A4*